# විෂයමාලා ආවරණය සඳහා යෝජිත වැඩසටහන

## තුන්වන ශ්‍රේණිය (පළමුවන වාරය)

## 2022

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

**යෝජිත වැඩසටහන සඳහා උපදෙස් මාලාව**

රටේ පැවති කොවිඩ් - 19 වසංගත තත්වය සහ අද වන විට රටේ පවත්නා සමාජ ආර්ථික අර්බුදය හේතුවෙන් 2021 වර්ෂයේ මෙන් ම 2022 වර්ෂයේ ද පළමුවන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය තෙක් ප්‍රාථමික අධ්‍යාපන අවධියේ අධ්‍යාපනය හදාරන සිසුන්ට සැලකිය යුතු අධ්‍යයන කාලයක් අහිමි වී ඇති බව නිරීක්ෂණය වී ඇත.

මෙලෙස සිසුන් හට ඉගෙනුම් කාලය අහිමි වීම හේතුවෙන් එම අධ්‍යයන වර්ෂය තුළ දී අනිවාර්යයෙන් ම අත්පත් කරගත යුතු අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගත හඳුනා ගෙන ඊට අනුව කාලය වෙන් කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම මෙමගින් අපේක්ෂිත ය.

ඒ අනුව ප්‍රාථමික අධ්‍යාපන අවධියේ එක් එක් ශ්‍රේණිවල පළමුවන වාරයට නිර්දිෂ්ට ඉගෙනුම් අන්තර්ගතවලින් අත්‍යවශ්‍ය ඉගෙනුම් කොටස් පමණක් මෙමගින් ඉදිරිපත් කරනු ලබයි. මෙම විෂය කොටස් සාධනය වූ විට දෙවන වාරයට අවශ්‍ය ඉගෙනුම් අවස්ථා සඳහා සුදුසුකම් ලබන බව වැඩිදුරටත් සඳහන් කරමු.

එමෙන් ම දැනටමත් පළමුවන වාරයට අදාළ යම් පමණක විෂය කොටස් ප්‍රමාණයක් ප්‍රමාණාත්මක ව හා ගුණාත්මක ව විවිධතාවලින් යුතු ව පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වී ඇත. එසේ වුවද අප විසින් යෝජනා කරනු ලබන්නේ පළමුවන වාරයට අදාළ ව සිසුන් විසින් අත්‍යවශ්‍යයෙන් ම අත්පත් කරගත යුතු විෂය කොටස් ය. මෙම යෝජිත විෂය කොටස්වලින් ද ඔබ පාසලේ ආවරණය වූ විවිධ විෂයය කොටස් තිබිය හැකි ය. එසේ වූ විට දී එම කොටස් අතහැර ඊළඟට ඇති විෂයය කොටසේ සිට පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීමට අපි විසින් යෝජනා කරන්නෙමු.

එමෙන් ම එක් එක් විෂය අන්තර්ගත සඳහා යෝජිත කාලය ඔබ පන්ති කාමරයේ සිටින සිසුන්ගේ සාධනය මත නම්‍යශීලී ව හා සාධාරණ ව වෙනස් කර ගැනීමට ඔබට නිදහස ඇත. එනමුත් යෝජිත විෂය අන්තර්ගතවලින් අඩු නොකොට ඒ සියල්ල මනා ලෙස සම්පූර්ණ කිරීමේ වගකීම ද ඔබ සතු ය.

එක් එක් විෂය සඳහා ගුරුමාර්ගෝපදේශයට අනුව පළමුවන වාරයට නිර්දිෂ්ට අනෙකුත් විෂය අන්තර්ගත සාධනයට අත්‍යවශ්‍ය ම වන ක්‍රියාකාරකම් ඉතාමත් සරල පැහැදිලි කිරීමකින් අනතුරු ව නිවෙස් පාදක ක්‍රමය ඔස්සේ ලබා දීමට හැකි වනු ඇත.

එසේ වුවත් නිවෙස් පාදක ක්‍රමය ඔස්සේ ලබා දෙන ක්‍රියාකාරකම් සිසුන්ට අනවශ්‍ය බරක්, පීඩනයක් නොවන ආකාරයට ලබා දීම ද ඔබ සතු වගකීමකි.

කෙසේ වුවත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සිසුන් සෞඛ්‍ය සම්පන්නව, ආරක්ෂිත ව, ප්‍රීතිමත් ව සහ ක්‍රියාශීලී ව ඒ සඳහා යොමු කරලීමේ වගකීම ද ඔබ සතු ය. ඒ අනුව ශ්‍රී ලාංකේය ප්‍රාථමික අධ්‍යාපනය හදාරන සිසුන්ගේ ඉගෙනුම් කාර්යය ශක්තිමත් හා ඵලදායී කරලීමේ උතුම් අරමුණින් මේ සියල්ල ක්‍රියාත්මක කිරීමට ඔබට ශක්තිය ලැබේවා යි පතමු.

**මව්බස (සිංහල)**

**තුන්වන ශ්‍රේණිය (පළමුවන වාරය)**

තුන්වන ශ්‍රේණියේ පළමුවන වාරය සඳහා ආවරණය කළ යුතු අත්‍යවශ්‍ය ම විෂය අන්තර්ගත පහත පරිදි යෝජනා කෙරෙයි. ඒ අනුව දී ඇති අනුක්‍රමයට අදාළ ව ඉගෙනුම් පල සාධනයට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කළ යුතු ය.

තුන්වන ශ්‍රේණියේ පළමුවන වාරයට යෝජිත මෙහි සඳහන් විෂය අන්තර්ගතවලට අදාළ ක්‍රියාකාරකම් කිරීමට පෙර දෙවන ශ්‍රේණියේ දී මව්බස විෂය සඳහා අත්පත් කරගත යුතු අත්‍යවශ්‍ය විෂය කොටස් සිසුන් තුළ සාධනය වී ඇද්දැයි පරීක්ෂා කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා පැය කිහිපයක් වෙන් කර සිසුන්ගේ හැකියාව මැන බැලීමට සහ සිසුන්ගේ පෙර මතකය ආවර්ජනය කිරීමට ඔබ විසින් සකස් කරන ලද ක්‍රියාකාරකම් සිසුන්ට ලබා දිය යුතු ය. ඒ අනුව එක් එක් සිසුන්ගේ සාධන මට්ටම පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔබ විසින් ලබා ගත යුතු ය. ඉන් පසු ව තුන්වන ශ්‍රේණිය සඳහා අප විසින් යෝජනා කරනු ලබන විෂය අන්තර්ගත සඳහා යොමු විය හැකි ය.

ඒ අනුව පළමුවන ප්‍රධාන අවධියේ අවසානය වන විට උගත් අකුරු භාවිත කර දෙවන ශ්‍රේණියේ දෙවන නිපුණතාවට අදාළ ක්‍රියාකාරකම් පුනරීක්ෂණ අභ්‍යාස ලෙසින් සිදු කළ යුතු අතර එහි දී පළමුවන ප්‍රධාන අවධියේ අකුරු ලියූ ප්‍රමාණයට ම ලිවීමට දිය යුතු ය.

එම අභ්‍යාසවලින් පසු ව තුන්වන ශ්‍රේණියට නිර්දිෂ්ට තනිරූලේ හතරෙන් තුන ප්‍රමාණයට අකුරු ලිවීමට අදාළ අභ්‍යාස කළ යුතු ය.

තුන්වන නිපුණතාවට අදාළ විෂය කොටස්වලින් යුතු අභ්‍යාස නිවෙස් පාදක ක්‍රමය ඔස්සේ ලබා දිය හැකි ය.

## තුන්වන ශ්‍රේණිය - මව්බස (සිංහල)

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | $L_1$<br>අවබෝධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා සවන් දෙයි.<br><br>$S_1$<br>අවබෝධයෙන් පැහැදිලි උච්චාරණය සහිත ව අර්ථය පැහැදිලි වන සේ කතා කරයි. | ■ පවසන ලද උපදෙස් අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.<br>■ කතන්දරවලට සවන් දී අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.<br>■ ළමා කවි කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.<br>■ සිද්ධි ගළපමින් කතන්දරයක් ඉදිරිපත් කරයි.<br>■ මාතෘකාවකට අදාළ ව පැහැදිලි ව අදහස් ප්‍රකාශ කරයි. | ■ පවසන දෙයට සවන් දීම.<br>■ කතන්දරවලට සවන් දීම.<br>■ ළමා කවිවලට සවන් දීම.<br>■ නිදහසේ කතන්දර කීම.<br>■ මාතෘකාවකට අදාළ ව කතා කිරීම. | ක්‍රියාකාරකම 1 | 12 | මි. 30 |
| | | | | ක්‍රියාකාරකම 2 | 12, 13 | මි. 30 |
| | | | | ක්‍රියාකාරකම 4 | 14, 15 | මි. 30 |
| | | | | ක්‍රියාකාරකම 5 | 15, 16 | පැය 01 |
| | | | | ක්‍රියාකාරකම 6 | 16 | පැය 01 |

## තුන්වන ශ්‍රේණිය - මව්බස (සිංහල)

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | R1 කියවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි.<br><br>W1 සම්මත නිවැරදි ක්‍රමයට ලියයි. | ■ අකුරේ නියමිත අංග, හැඩය, ප්‍රමාණය, දිශාව පිළිබඳ සැලකිලිමත් වෙමින් සරල වාක්‍ය ලියයි.<br><br>■ කියවීමේ කුසලතා ප්‍රදර්ශනය සඳහා ශබ්ද නගා කියවයි.<br><br>■ නිවැරදි උච්චාරණයෙන් යුතු ව සරල වාක්‍ය කියවයි.<br><br>■ විරාම ලක්ෂණ සැලකිල්ලට ගෙන නිවැරදි අර්ථ ප්‍රකාශ කරයි. | කියවීමට හා ලිවීමට සූදානම් වීම. | | 17 | මි.30 |
| | | | පළමු ප්‍රධාන අවධියේ දී තනි රූලේ අකුරු ලිවීමට දුන් ප්‍රමාණයට ම අකුරු ලිවීමට දීම, බලා ලිවීමේ හා අසා ලිවීමේ ක්‍රියාකාරකම්. | | | පැය 01 |
| | | | 3 ශ්‍රේණියට අදාළ 3/4 ප්‍රමාණයට අකුරු ලිවීම. | | 18 | පැය 01 |
| | | | පිලි රහිත වචන කියවීම. | 01 | 19 | පැය 01 |
| | | | පිලි රහිත සරල වාක්‍යාංශ/වාක්‍ය කියවීම. | 02 | 19 | පැය 01 |
| | | | පිලි සහිත වචන ලිවීම. | 01 | 19<br>20 | පැය 01 |
| | | | පිලි සහිත වාක්‍ය ලිවීම. | 01 | 20 | පැය 01 |
| | | | පිලි සහිත වචනවල වෙනස හඳුන්වා දීම.<br>'ආ' ශබ්දය - 'ා' | 01 | 20<br>21 | පැය 01 |

### තුන්වන ශ්‍රේණිය - මව්බස (සිංහල)

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | | | ■ 'ඇ' ශබ්දය - ' ැ ',<br>'ඈ' ශබ්දය - ' ෑ ' සහිත වචන කියවීම හා ලිවීම.<br><br>■ 'ඇ' ශබ්දය හා 'ඈ' ශබ්දය සහිත වාක්‍ය කියවීම හා ලිවීම. | 02 | 22<br>23 | පැය 01 |
| | | | ■ 'ඉ' ශබ්දය - ' ි ' ,<br>'ඊ' ශබ්දය - ' ී ' සහිත වචන කියවීම හා ලිවීම.<br><br>■ 'ඉ' ශබ්දය හා 'ඊ' ශබ්දය සහිත වාක්‍ය කියවීම හා ලිවීම. | 03 | 23<br><br>24<br><br>25 | පැය 01 |
| | | | ■ 'උ' ශබ්දය - ' ු , ැ , ු ' හා<br>'ඌ' ශබ්දය - ' ූ, ෑ , ූ ' සහිත වචන කියවීම හා ලිවීම.<br><br>■ 'උ' ශබ්දය හා 'ඌ' ශබ්දය සහිත වාක්‍ය කියවීම හා ලිවීම. | 04 | 25<br><br>26 | පැය 01 |
| | | | ■ 'එ' ශබ්දය - 'ෙ' හා 'ඒ' ශබ්දය - 'ෙ'<br>'ේ ' සහිත වචන කියවීම හා ලිවීම.<br><br>■ 'එ' ශබ්දය හා 'ඒ' ශබ්දය සහිත වාක්‍ය කියවීම හා ලිවීම. | 06 | 27 | පැය 01 |

## තුන්වන ශ්‍රේණිය - මව්බස (සිංහල)

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | | | ■ 'ඔ' ශබ්දය - 'ො' හා 'ඕ' ශබ්දය -'ෝ' සහිත වචන කියවීම හා ලිවීම. | 07 | 28<br>29 | පැය 01 |
| | | | ■ 'ඔ' ශබ්දය හා 'ඕ' ශබ්දය සහිත වාක්‍ය කියවීම හා ලිවීම. | 07 | 28<br>29<br>30 | |
| | | | ■ ගැට ඇලපිල්ල සහිත වචන කියවීම හා ලිවීම.<br>■ ගැට ඇලපිල්ල සහිත වාක්‍ය කියවීම හා ලිවීම.<br>■ ගැට ඇලපිල්ල සහිත වචන පෙළ පොතෙන් සොයා ලිවීම. | 08 | 30 | පැය 01 |
| | | | ■ ගැට ඇලපිලි දෙක සහිත වචන කියවීම හා ලිවීම.<br>■ ගැට ඇලපිලි දෙක සහිත වාක්‍ය කියවීම හා ලිවීම. | 09 | 31 | පැය 01 |
| | | | ■ කොම්බු දෙක යෙදුණු වචන කියවීම හා ලිවීම.<br>■ කොම්බු දෙක යෙදුණු වාක්‍ය කියවීම හා ලිවීම. | 10 | 31 | පැය 01 |

## තුන්වන ශ්‍රේණිය - මව්බස (සිංහල)

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | | | ■ කොම්බුව හා ගයනුකිත්ත යෙදුණු වචන කියවීම හා ලිවීම.<br><br>■ කොම්බුව හා ගයනුකිත්ත යෙදුණු වාක්‍ය කියවීම හා ලිවීම. | 11 | 31<br>32 | පැය 01 |
| | | | ■ ඡේදයක් කියවා දී ඇති අකුරුවලින් පටන් ගන්නා වචන කියවීම හා ලිවීම. | 12<br>13 | 32<br>33 | පැය 01 |
| | | | ■ විරාම ලකුණු හඳුන්වා දීම. විරාම ලකුණ තිත (.)තිත යෙදුණු වාක්‍ය හා ඡේද කියවීම හා ලිවීම.<br><br>■ සිංහල කියවීම් පොතෙන් තිත යෙදුණු වාක්‍ය සොයා කියවීම හා ලිවීම. | 01 | 34 | පැය 02 |
| | | | ■ ප්‍රශ්නාර්ථ ලකුණ නිවැරදි ව යෙදීම.<br><br>■ ප්‍රශ්නාර්ථ ලකුණ සහිත වාක්‍ය හා ඡේද කියවීම හා ලිවීම. | 02 | 34 | පැය 02 |
| | | | ■ කොමාව නිවැරදි තැන යොදා වාක්‍ය කියවීම හා ලිවීම. | 03 | 34 | පැය 02 |

## තුන්වන ශ්‍රේණිය - මව්බස (සිංහල)

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
| --- | --- | --- | --- | --- | --- | --- |
| | | | ▪ යුගල උඩු කොමා නිවැරදි තැන යොදා ඡේද කියවීම හා ලිවීම.<br>▪ කියවීම පොතෙන් යුගල උඩු කොමා සහිත වාක්‍ය කියවීම හා ලිවීම.<br>▪ විරාම ලකුණුවලට අනුගත ව ශබ්ද නගා කියවීම.<br>▪ විරාම ලකුණුවලට අනුගත ව නිශ්ශබ්ද ව කියවීම.<br>▪ කියවීම් පොතෙහි පාඩම් විරාම ලකුණුවලට අනුගත ව කියවීම. | 04 | 34 | පැය 04 |

**තුන්වන ශ්‍රේණිය - මව්බස (සිංහල)**

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | L2<br>සවන් දීමේ කුසලතා සංවර්ධනය සඳහා සවන් දෙයි. | වචනවල ශබ්දමය වෙනස්කම් හඳුනා ගෙන භාවිත කරයි. | ▪සරල ඡේද | 01 | 36 | පැය 01 |
| | S2<br>කථන කුසලතා සංවර්ධනය සඳහා කතා කරයි. | වචනවල ශබ්දමය වෙනස්කම් හඳුනා ගෙන භාවිත කරයි. | ▪සරල ඡේද | 02 | 37 | පැය 01 |
| | R2<br>කියවීමේ කුසලතා සංවර්ධනය සඳහා කියවයි. | සරල ඡේදයක් කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි. | ▪සරල ඡේද | 03 | 38 | පැය 01 |
| | W2<br>ලිවීමේ කුසලතා සංවර්ධනය සඳහා ලියයි. | සරල ඡේදයක් කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි. | ▪සරල ඡේද | 04 | 39<br>40 | පැය 01 |
| | | | | | මුළු කාලය | පැය 35 |

**ගණිතය**

**තුන්වන ශ්‍රේණිය (පළමුවන වාරය)**

ගණිතය විෂයමාලාවේ තුන්වන ශ්‍රේණියේ පළමු වාරයට අදාළ අත්‍යවශ්‍ය ම ඉගෙනුම් සංකල්ප සාධනය සඳහා අවශ්‍ය විෂය අන්තර්ගතය මෙහි ඇතුළත් කර ඇත. සිසුන් පීඩනයට පත් නොවන අයුරින් ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා මෙය උදවු කර ගන්න. මෙහි යෝජනා කර ඇති කාලය උචිත පරිදි ගළපා ගනිමින් ගුරු මාර්ගෝපදේශයේ දක්වා ඇති මගපෙන්වීම් ද ප්‍රයෝජනයට ගෙන ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න.

තුන්වන ශ්‍රේණියේ පළමුවන වාරයට යෝජිත මෙහි සඳහන් විෂය අන්තර්ගතවලට අදාළ ක්‍රියාකාරකම් කිරීමට පෙර දෙවන ශ්‍රේණියේ දී ගණිතය විෂය සඳහා අත්පත් කරගත යුතු අත්‍යවශ්‍ය විෂය කොටස් සිසුන් තුළ සාධනය වී ඇද්දැයි පරීක්ෂා කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා පැය කිහිපයක් වෙන් කර සිසුන්ගේ හැකියාව මැන බැලීමට සහ සිසුන්ගේ පෙර මතකය ආවර්ජනය කිරීමට ඔබ විසින් සකස් කරන ලද ක්‍රියාකාරකම් සිසුන්ට ලබා දිය යුතු ය. ඒ අනුව එක් එක් සිසුන්ගේ සාධන මට්ටම පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔබ විසින් ලබා ගත යුතු ය. ඉන් පසු ව තුන්වන ශ්‍රේණිය සඳහා අප විසින් යෝජනා කරනු ලබන විෂය අන්තර්ගත සඳහා යොමු විය හැකි ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර සිසුන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා අත්කරගෙන ඇති ද යන්න තහවුරු කර ගන්න. ක්‍රියාකාරකම්වලට උචිත අයුරින් ගණිතය වැඩ පොත සඳහා ද සිසුන් යොමු කරන්න. සමහර නිපුණතාවලට අදාළ ක්‍රියාකාරකම් පන්ති කාමරය තුළ සිදු කිරීමෙන් පසු ව එම සංකල්ප තව දුරටත් තහවුරු කිරීම සඳහා නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ද අභ්‍යාස සඳහා සිසුන් යොමු කළ හැකි ය.

### තුන්වන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | 1. එක ම වර්ගයේ ද්‍රව්‍ය/රූප 100 කට නොවැඩි සංඛ්‍යාවක් දෙකේ, පහේ සහ දහයේ ඒවායින් ගණන් කරයි. | 1.1 එක ම වර්ගයේ ද්‍රව්‍ය /රූප 100 කට නොවැඩි සංඛ්‍යාවක් දෙකේ ඒවායින් ගණන් කරයි.<br><br>1.2 එක ම වර්ගයේ ද්‍රව්‍ය /රූප 100 කට නොවැඩි සංඛ්‍යාවක් පහේ ඒවායින් ගණන් කරයි.<br><br>1.3 එක ම වර්ගයේ ද්‍රව්‍ය /රූප 100 කට නොවැඩි සංඛ්‍යාවක් දහයේ ඒවායින් ගණන් කරයි. | ▪ ද්‍රව්‍ය/රූප ගණන් කිරීම. | පාඩම 01 ක්‍රියාකාරකම 2, 3, 4 | 3 සහ 4 | පැය 02 |
| . | 2. 100 තෙක් සංඛ්‍යා හඳුනා ගෙන අවබෝධයෙන් යුතු ව භාවිත කරයි. | 2.1 100 තෙක් ඕනෑම සංඛ්‍යාංකයක් කියවයි.<br><br>2.2 100 තෙක් ඕනෑම සංඛ්‍යාංකයක් සහ සංඛ්‍යා නාමයක් නිවැරදි ව ලියයි.<br><br>2.3 දහයස්ථානය තෙක් සංඛ්‍යාවක එක් එක් ඉලක්කමෙහි ස්ථානීය අගය දක්වයි.<br><br>2.4 එකේ ඒවා සහ දහයේ ඒවා ඇසුරින් සංඛ්‍යා නිරූපණය කරයි. | ▪ 100 තෙක් සංඛ්‍යා නාම ලිවීම, කියවීම සහ ස්ථානීය අගය දැක්වීම. | පාඩම 02 ක්‍රියාකාරකම 1 සිට 5 | 5 සිට 8 | පැය 02 |

තුන්වන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | 3 ඉලක්කම් දෙකකට නොවැඩි සංඛ්‍යා ගෙන යාම් රහිත ව එකතු කිරීමේ ගැටලු විසඳයි. | 3.1 ඉලක්කම් දෙකේ සංඛ්‍යා දෙකක් (ගෙන යාම රහිත ව) එකතු කර එකතුව ප්‍රකාශ කරයි.<br><br>3.2 ඉලක්කම් දෙකකට නොවැඩි සංඛ්‍යා දෙකක් ස්ථානීය අගය සලකමින් ගෙන යාම රහිත ව එකතු කිරීමේ සරල ගැටලු විසඳයි. | ▪ ඉලක්කම් දෙකේ සංඛ්‍යා (ගෙන යාම රහිත ව) එකතු කිරීම. | පාඩම 03 ක්‍රියාකාරකම 1 සිට 5 | 9 සිට 15 | පැය 05 |
| . | 4 දිග මැනීමේ සම්මත ඒකකය ලෙස මීටරය හඳුනා ගෙන මීටරය භාවිතයෙන් දිග මනියි. | 4.1 අභිමත ඒකක භාවිතයෙන් දිග මනියි. වාර්තා කරයි.<br><br>4.2 දිග මැනීමේ දී සම්මත ඒකක භාවිතයෙහි අවශ්‍යතාව අවබෝධ කරගෙන මීටරය භාවිතයෙන් දිග මනියි.<br><br>4.3 නිවැරදි ව මීටර කෝදුව භාවිත කර වස්තුවල දිග මැන වාර්තා කරයි. | ▪ අභිමත ඒකකවලින් දිග මැනීම.<br><br>▪ සම්මත ඒකකයෙන් දිග මැනීම.<br><br>▪ මීටරය (m) භාවිත කිරීම. | පාඩම 04 ක්‍රියාකාරකම 1 සිට 3 | 16 සිට 18 | පැය 02 |

### තුන්වන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | 5 ගෙන ඒම රහිත අවස්ථා ඇතුළත් සරල අඩු කිරීමේ ගැටලු විසඳයි. | 5.1 18 ට නොවැඩි සංඛ්‍යාවකින් ඊට අඩු සංඛ්‍යාවක් අඩු කර පිළිතුර ප්‍රකාශ කරයි. | ■ සංඛ්‍යා අඩු කිරීම. | පාඩම 05 ක්‍රියාකාරකම 1 සිට 3 | 19 සිට 22 | පැය 05 |
| . | 6 දවස්, සති හා මාස අතර සම්බන්ධතා හඳුනා ගෙන භාවිත කරයි.<br><br>ඔරලෝසුවේ දැක්වෙන වේලාව කියවයි. | 6.1 දවස්වල සහ මාසවල නම් නිවැරදි ව ප්‍රකාශ කරයි.<br><br>6.2 දවස්, සති හා මාස අතර සම්බන්ධතාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br><br>6.3 පැයෙන් පැයට ඔරලෝසුවේ දැක්වෙන වේලාව කියවයි. | ■ දවස්, සති හා මාස අතර සම්බන්ධතා<br><br>■ ඔරලෝසුවේ දැක්වෙන වේලාව කියවීම. | පාඩම 06 ක්‍රියාකාරකම 1, 2 සහ 4 | 23 සිට 27 | පැය 02 |

## තුන්වන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | 8 10 තෙක් සංඛ්‍යාවක් දෙකෙන් ගුණ කරයි. | 8.1 දෙකෙහි ගුණන වගුව ගොඩනගා කියවයි.<br><br>8.2 දෙකෙහි ගුණන වගුව මතකයෙන් කියයි.<br><br>8.3 10 තෙක් සංඛ්‍යාවක් දෙකෙන් ගුණ කර ගුණිතය ප්‍රකාශ කරයි. | ■ 2 හි ගුණන වගුව සහ ගුණ කිරිම. | පාඩම 07 ක්‍රියාකාරකම 1 සිට 3 | 28 සිට 31 | පැය 05 |
| | 9 ඝන වස්තු හා ජ්‍යාමිතික හැඩවල ලක්ෂණ හා ස්වභාවය හඳුනා ගෙන ක්‍රියාකාරකම්හි නිරත වෙයි. | 9.1 සමචතුරස්‍රය, ඍජුකෝණාස්‍රය, වෘත්තය සහ ත්‍රිකෝණය යන ජ්‍යාමිතික හැඩ නම් කරයි.<br><br>9.2 ද්විමාන ජ්‍යාමිතික හැඩ අඳියි.<br><br>9.3 ජ්‍යාමිතික හැඩවල ලක්ෂණ ප්‍රකාශ කරයි.<br>9.4 ඝනකය, ඝනකාභය. සිලින්ඩරය, ගෝලය සහ චතුස්තලය යන ජ්‍යාමිතික ඝනවස්තුවල ලක්ෂණ ප්‍රකාශ කරයි. | ■ ජ්‍යාමිතික හැඩතල සහ ඝන වස්තු<br><br>■ නිර්මාණ | පාඩම 08 ක්‍රියාකාරකම 1 සිට 5 | 32 සිට 35 | පැය 05 |

## තුන්වන ශ්‍රේණිය -ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | 10 යම් ද්‍රව්‍ය සංඛ්‍යාවක් සම සම ව බෙදයි. | 10.1 ද්‍රව්‍ය ඇසුරෙන් ශේෂය රහිත ව 20 ට අඩු සංඛ්‍යාවක් සම සම ව දෙදෙනකු අතර බෙදයි.<br><br>10.2 ශේෂය සහිත අවස්ථාවක 20 ට අඩු යම් ද්‍රව්‍ය සංඛ්‍යාවක් සම සම ව බෙදයි. ඉතුරු ව ප්‍රකාශ කරයි.<br><br>10.3 20 ට අඩු ද්‍රව්‍ය සංඛ්‍යාවක් සම සම ව බෙදා ගැනීමට අදාළ සරල ගැටලු විසඳයි. | ▪ ද්‍රව්‍ය ප්‍රමාණ සම සම ව බෙදීම. | පාඩම 09 ක්‍රියාකාරකම 1 සිට 5 | 36 සිට 38 | පැය 05 |
| | 11 විධිමත් වස්තු හා හැඩ ඇසුරෙන් බාගය සහ කාල හඳුනා ගෙන නම් කරයි. | 11.1 විධිමත් වස්තු සහ හැඩ ඇසුරෙන් බාගය සහ කාල හඳුනා ගෙන දක්වයි.<br><br>11.2 බාග දෙක එකතු කළ විට නැවත සම්පූර්ණ එකක් වන බව පිළිගනියි.<br>11.3 සම්පූර්ණ එකක් සමාන කොටස් හතරකට බෙදූ විට එක් කොටසක් කාලක් වන බව පිළිගනියි. | ▪ බාග සහ කාල හඳුනා ගැනීම. | පාඩම 10 ක්‍රියාකාරකම 1 සහ 2 | 39 සිට 41 | පැය 02 |
| | | | | | මුළු කාලය | පැය 35 |

**පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්**

**තුන්වන ශ්‍රේණිය (පළමුවන වාරය)**

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ පස්වන ශ්‍රේණියට අදාළ අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගතය මෙහි දක්වා ඇත. ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී පරිසර ගවේෂණය, විද්‍යාත්මක සංකල්ප භාවිතය සිසුන් සමග සිදු කළ යුතු අතර මෙහි සඳහන් අනෙකුත් ඉගෙනුම් පලවලට අදාළ ක්‍රියාකාරකම් විශේෂයෙන් සෞන්දර්ය, ක්‍රීඩා හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් නිවෙස පාදක ව සිදු කිරීමට ද සිසුන් යොමු කළ යුතු ය. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වලට අදාළ කවි, ගීත ආදියෙහි අර්ථය ගායනයට පෙර සිසුන්ට පැහැදිලි කරමින් ඊට අදාළ ප්‍රකාශනාත්මක චලන ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

චිත්‍ර ඇඳීමේ දී, ඇඹීමේ දී, ආකෘති ගොඩනැගීමේ දී සිසුන්ගේ ඇති දක්ෂතාවලින් ම සිය නිර්මාණ එළිදැක්වීමටත් ඒවා අගය කරමින් ඔවුන්ගේ නිර්මාණාත්මක කුසලතා සංවර්ධනය කිරීමටත් උත්සුක විය යුතු ය. නිවෙස් පාදක ව ක්‍රියාකාරකම් සිදු කරන සෑම අවස්ථාවක දී ම සිසුන්ගේ හැකියා වර්ධනය වන පරිදි ඊට අදාළ ක්‍රියාකාරකම් ඔවුන් විසින් ම කිරීම සඳහා යොමු කළ යුතු ය. සිසු නිර්මාණ පාසලට පැමිණෙන දිනයන්හි රැගෙන ඒමට හා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා ගන්න. කණ්ඩායම් ලෙස හෝ තනි තනි ව ප්‍රදර්ශනය කිරීමටත් ඒවා අගය කිරීමටත් කටයුතු කරන්න.

සිසුන් තුළ යහපත් ආකල්ප ඉස්මතු වන ආකාරයට සෑම ක්‍රියාකාරකමක් ම ගොඩනගා ගන්න. **ආදරය, කරුණාව, දයාව වැනි සංවර්ධනාත්මක චිත්තවේග දියුණු කිරීමටත්** කේන්තිය, හිංසාව, රිදවීම වැනි අහිතකර චිත්තවේග පාලනය කිරීමටත් සෑම ක්‍රියාකාරකමකින් ම සමාජ හිතවාදී චර්යා ඉස්මතු කිරීමටත් වග බලා ගන්න.

**අන්මත ඉවසීම, අන් අයට ගරු කිරීම, නායකත්වයට ගරු කිරීම, සාමූහික ව කටයුතු කිරීම** ආදී සමාජ කුසලතා වර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීමට කටයුතු කරන මෙන් තව දුරටත් ඉතා ආදරයෙන් ඉල්ලා සිටිමු.

ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි විෂයයට අදාළ ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී ගුරු මාර්ගෝපදේශයේ දෙන ලද උපදෙස් අනුව කටයුතු කරන්න. ගීතවලට සහ වචනවලට අදාළ ශ්‍රව්‍ය පට (Audio materials) www.nie.lk - Downloads - other materials - English - ABOE මගින් ලබා ගන්න.

තුන්වන ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාවය | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| තමා අවට පරිසරය, පිරිසිදු ව ක්‍රමවත් ව පවත්වා ගෙන යාමට ක්‍රියාශීලි ලෙස දායක වෙයි. | 1. අපේ යහපැවැත්ම | • මනා සංවිධානයකින් යුතු ව කටයුතු කිරීමෙන් තම කටයුතු සාර්ථක ව සිදු කර ගනියි. | • අත්මාභිමානයක් ඇති ව පන්තිකාමරයේ හා පාසල් කටයුතුවලට සහභාගි වෙයි. | 01 | 131 | පැය 9 |
| | | • යහගුණ අගය කරමින් ඒවා පවත්වා ගෙන යාමට කටයුතු කරයි. | • පාසලේ හා පන්තියේ තමාට බලපාන නීතිරීති හඳුනා ගෙන ඒවාට අනුගත ව කටයුතු කරයි. | 02 | 132 | |
| | | • ශාරීරික සහ මානසික යහපැවැත්ම සඳහා යෝග්‍ය ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | • සැලසුම් සහගත ව කටයුතු කිරීමේ හුරුකම් ප්‍රදර්ශනය කරයි. | 03 | 133 | |
| | | • නීතිරීති අගය කරමින් නීති ගරුක ව හැසිරෙයි. | • තමා තුළ ඇති හැකියා හඳුනා ගෙන නිර්මාණවල යෙදෙයි. | 04 | 134 | |
| | | • වගකීම් ඉටු කරමින් පොදු කටයුතු සඳහා දායකත්වය ලබා දෙයි. | ABOE - Song Win or Loss.....<br>ABOE - Convesational Language | 05 | 135 | |
| | | • නීතිරීති අගය කරමින් නීති ගරුක ව හැසිරෙයි. | | 01 සංවාදය,<br>02 සංවාදය,<br>03 සංවාදය | 236 | |

තුන්වන ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාවය | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| ජාතික ධජය, ජාතික ගීය, පාසල් ධජය හා පාසල් ගීය කෙරෙහි අභිමානයෙන් යුතු ව හැසිරෙයි. | 2. අපි ලක් වැසියෝ | ▪ ශ්‍රී ලාංකික සංස්කෘතික හා ජාතික උරුමයන්හි ලක්ෂණ විමර්ශනය කරමින් ඒවා රැක ගැනීමට දායක වෙයි.<br>▪ චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ අවබෝධයෙන් යුතු ව ඒවා පවත්වා ගැනීමට දායක වෙයි.<br>▪ විවිධ ජන වර්ග, ඔවුන්ගේ සංස්කෘතික ලක්ෂණ හා අනන්‍යතාවන් අගය කරමින් ඒවා රැක ගැනීමට දායක වෙයි. | ▪ ජාතික කොඩිය එසවීමේ දී අනුගමනය කරන සිරිත් පිළිපදියි.<br>▪ ජාතික ගීය නිවැරදි උච්චාරණ සහිත ව නිවැරදි ඉරියව්වේ පිහිටුවා ගායනය කරයි.<br>▪ ජාතික දිනයක් වශයෙන් නිදහස් දිනයෙහි ඇති වටිනාකම හඳුනා ගනිමින් එය අභිමානවත් ව සමරයි.<br>▪ ශ්‍රී ලංකිකයන් විවිධ ජන වර්ගවලින් යුක්ත බව දැන ගනියි.<br>▪ විවිධ ජන වර්ගයන්ට අයත් වූ සංස්කෘතික ලක්ෂණ අගය කරමින් කටයුතු කරයි.<br>ABOE - Song We are Sri Lankans.....<br>ABOE - Convesational Language | 01<br>02<br>03<br>04<br>05<br>04 සංවාදය<br>05 සංවාදය | 138<br>139<br>140<br>141<br><br>240<br>236 | පැය 6 |

## තුන්වන ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාවය | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| ■ පැළයක වර්ධනය විමසිලිමත් ව නිරීක්ෂණය කරමින් සොබා දහමේ පැවත්මට දායක වෙයි. | 3. පැළෑටි හා ගස්වැල් | ● ආසන්න පරිසරයේ පැළෑටිවල හා ගස් වැල්වල ලක්ෂණ හා වැඩෙන ආකාරය හඳුනා ගෙන වාර්තා කරයි. | ● ආසන්න පරිසරයේ වැඩෙන විවිධ ශාක නිරීක්ෂණය කර වාර්තා කරයි. | 01 | 144 | පැය 9 |
| | | | ● ආසන්න පරිසරයේ විවිධ වූ ස්ථාන කිහිපයක පැළ වැඩෙන ආකාරය විමර්ශනය කරයි. | 02 | 145 | |
| ■ එළිමහනේ කරනු ලබන අත්හදා බැලීමකින් ලද නිරීක්ෂණ හා ප්‍රතිඵල තමාගේ වචනයෙන් ලියයි. | | ● ශාක අතර පවතින සුවිශේෂ වෙනස් කම් විමර්ශනය කර වාර්තා කරයි. | ● ගස්වැල්, පැළෑටි හා බැදුණු ආකල්පිය වටිනාකම හඳුනා ගෙන අනුගමනය කරයි. | 03 | 146 | |
| | | ● ශාක සමඟ මිනිසා හා සතුන් දක්වන සබඳතාව අධ්‍යයනය කර වාර්තා කරයි. | ● විවිධ ශාකපත්‍ර හැඩය අනුව කාණ්ඩ කරයි. | 04 | 147 | |
| | | | ● ශාකවල වර්ධනයට අවශ්‍ය සාධක පරීක්ෂා කර, ඒ පිළිබඳ අද්දැකීම් ප්‍රකාශ කරයි. | 05 | 148 | |
| | | ● පැළෑටිවල හා ගස් වැල්වල වටිනාකම අගය කරමින් ඒවා රැක බලා ගැනීමට කටයුතු කරයි. | ● ශාකවලින් ලැබෙන ප්‍රයෝජන හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 06 | | |
| | | | ABOE - Song Large Plants.....<br>ABOE - Convesational Language | 06 සංවාදය<br>07 සංවාදය | 236 | |

## තුන්වන ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාවය | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| ■ පාරිසරික සම්පත් ආරක්ෂා කර ගැනීම සඳහා දායක වෙයි.<br>■ රැස් කළ තොරතුරු වර්ග හා ප්‍රවර්ග කර දක්වයි.<br>■ උචිත අභින භාවිත කරමින් චරිතාරෝපිත ඉදිරිපත් කිරීමක නියැළෙයි. | 4. අප අවට සත්තු | ● සතුන් පිළිබඳ මූලික තොරතුරු සුවිශේෂ හැකියා, චර්යා රටා ගවේෂණය කර වර්තා කරයි.<br>● පරිසරයේ පැවැත්ම සඳහා සතුන්ගේ වැදගත්කම අගය කරමින් එම සතුන් ආරක්‍ෂා කර ගැනීමට දායක වෙයි.<br>● මිනිස් හා සත්ත්ව ජීවිතයන්හි ජීවත් වීමේ අයිතිය හා වටිනාකම ප්‍රකාශ කරයි.<br>● සතුන්ගෙන් වන හානිය හා අනතුරු පිළිබඳ ව සැලකිලිමත් ව ක්‍රියා කරයි.<br>● විවිධ මාධ්‍ය භාවිතයෙන් සත්ත්ව රූප නිර්මාණය කරයි.<br>● සත්ත්ව චර්යා පිළිබඳ චලන ගවේෂණ සහ අනුකරණ ක්‍රියාකාරකම්වල යෙදෙයි. | ● නිවසේ ඇති කරන හා නිවස ආශ්‍රිත ව ගැවසෙන සතුන්ගෙන් ඇති ප්‍රයෝජන විස්තර කරයි.<br>● නිවස ආශ්‍රිත පරිසරයේ වෙසෙන සතුන්ගේ සුවිශේෂ හැකියා පිළිබඳ අධ්‍යයනය කර වාර්තා කරයි.<br>● නිවස ආශ්‍රිත පරිසරයේ ජීවත් වන සතුන්ගෙන් වන හානි හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>● නිවස ආශ්‍රිත පරිසරයේ ජීවත් වන සතුන්ගෙන් වන හානිවලින් ආරක්ෂා විය හැකි ආකාර ප්‍රකාශ කරයි.<br>● සතුන් කෙරෙහි සංවේදී වෙමින් ඔවුන් රැක ගැනීමට දායක වෙයි.<br>● සතුන්ගේ විවිධ ලක්ෂණ මාධ්‍ය ඇසුරෙන් ප්‍රදර්ශනය කරයි.<br>ABOE - Song They are animal.....<br>ABOE - Convesational Language | 01<br>02<br>03<br>04<br>05<br>06<br>07<br>08 සංවාදය | 151<br>153<br>154 155<br>237<br>236 | පැය 9 |

## තුන්වන ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාවය | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| තමන්ට සේවා සපයන පුද්ගලයන් කෙරෙහි කෘතවේදී බව ප්‍රදර්ශනය කරයි. | 5. අප පරිහරණය කරන දේ | • යම් කාර්යයක් සඳහා සුවිශේෂ භාණ්ඩ හා උපකරණ හඳුනා ගනිමින් ඒවා නිවැරදි ව, ක්‍රමානුකූල ව හා ආරක්ෂා සහිත ව පරිහරණය කරයි.<br>• සම්පත්වලින් උපරිම ප්‍රයෝජනයක් ලැබෙන පරිදි අරපිරිමැස්මෙන් යුතු ව කටයුතු කරයි.<br>• එදිනෙදා පරිහරණය කරන දෑ වඩාත් ආකර්ෂණීය ලෙස සකස් කර ගැනිම සඳහා විවිධ නිර්මාණය කරයි.<br>• අප පරිහරණය කරන දේ ඇසුරු කර ගනිමින් විවිධ ජන නැටුම්වල යෙදෙයි. | • පන්ති කාමරයේ භාවිත කරන උපකරණ හා භාණ්ඩ ඒවායින් ඉටු කෙරෙන කාර්යය අනුව හඳුනා ගැනෙයි.<br>• භාණ්ඩ හා උපකරණ භාවිත කිරීමේ දී සැලකිලිමත් විය යුතු අංග පිළිබඳ ව දැනුම්වත් ව ක්‍රියා කරයි.<br>• නිතර පරිහරණය කරන භාණ්ඩ හා උපකරණ භාවිත කිරීමේ දී හුරුවක් සහිත ව ක්‍රියාකාරී ව භාවිත කිරීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.<br>• බැලැන්කට් මැස්ම පිළිබඳ මුලික හුරුකම් ලබයි. | 01<br>02<br>04<br>05 | 159<br>160<br>161<br>162 | පැය 9 |

තුන්වන ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාවය | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | | ● උපකරණවල ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධයෙන් යුතු ව වඩාත් ඵලදායි ලෙස භාවිත කරයි. | ● අප පරිහරණය කරන උපකරණ ආශ්‍රිත ජන නැටුම්වල යෙදෙයි.<br><br>ABOE - Song Books in the Library.....<br>ABOE - Convesational Language | 07<br><br><br>09 සංවාදය<br>10 සංවාදය | 163<br>164<br><br>238<br>236<br>237 | |
| | | | | | මුළු කාලය | පැය 42 |

තුන්වන ශ්‍රේණිය -දෙවන ජාතික භාෂාව

| නිපුණතාව | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම් අංකය | පිටු අංකය | කාලය |
|---|---|---|---|---|
| තමා පිළිබඳ තොරතුරු ප්‍රකාශ කරයි. | **உங்கள் பெயர் என்ன?** (උංගළ් පෙයර් එන්න?)<br>ඔයාගේ නම මොකක් ද ?<br>**நான்/எனது பெயர். . .**(නාන්/එනදු පෙයර් . . )<br>මම/මගේ නම . .<br>**உங்கள் ஊர் எது?** (උංගළ් ඌර් එදු?)<br>ඔයාගේ ගම කොහේ ද?<br>**எனது ஊர் . . .** (එනදු ඌර් . . . )<br>මගේ ගම . . .<br>**உங்கள் வயது எத்தனை?** (උංගළ් වයදු එත්තනෛ?)<br>ඔයාගේ වයස කීයද ?<br>**எனது வயது . . .** (එනදු වයදු . . .)<br>මගේ වයස . . .<br>**உங்கள் பாடசாலை எது?** (උංගළ් පාඩසාලෛ එදු?)<br>ඔයාගේ පාසල මොකක් ද ?<br>**எனது பாடசாலை . . .** (එනදු පාඩසාලෛ . . .)<br>මගේ පාසල . . . | 1 සිට 4 | 250 සිට 252 | පැය 2 |
| පාසලේ පොදු ස්ථාන නම් කරයි. | **வகுப்பு** වහුප්පු පන්තිය<br>**மைதானம்** මෛදානම් ක්‍රීඩා පිට්ටනිය<br>**அதிபர் காரியாலயம்** අදිඃර් කාරියාලයම් විදුහල්පති කාර්යාලය<br>**மலசலகூடம்** මලසලකූඩම් වැසිකිළිය<br>**நூலகம்** නූලහම් පුස්තකාලය | 1 සිට 4 | 253 සිට 255 | පැය 2 මි 30 |

තුන්වන ශ්‍රේණිය -දෙවන ජාතික භාෂාව

| නිපුණතාව | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම් අංකය | පිටු අංකය | කාලය |
|---|---|---|---|---|
| පාසලේ දී තම අවශ්‍යතා සඳහා වූ සුහද ඉල්ලීම් කරයි. | **எனக்கு பேனை தாருங்கள்.** එනක්කු පේනෛ තාරුංගළ්<br>මට පෑන දෙන්න<br>**எனக்கு தண்ணீர் தாருங்கள்.** එනක්කු තණ්ණීර් තාරුංගළ්<br>මට වතුර දෙන්න<br>**எனக்கு புத்தகம் தாருங்கள்.** එනක්කු පුත්තහම් තාරුංගළ්<br>මට පොත දෙන්න<br>**உள்ளே வரலாமா?** උල්ළේ වරලාමා?<br>ඇතුළට එන්නද ?<br>**வெளியே போகலாமா?** වෙළියේ පෝහලාමා?<br>එළියට යන්නද ?<br>**நான் உள்ளே வரலாமா?** නාන් උල්ළේ වරලාමා?<br>මම ඇතුළට එන්නද ?<br>**நான் வெளியே போகலாமா?** නාන් වෙළියේ පෝහලාමා?<br>මම එළියට යන්න ද ? | 1 සිට 4 | 256 සහ 257 | පැය 2<br>මි 30 |
| | | | මුළු කාලය | පැය 7 |

තුන්වන ශ්‍රේණිය - බුද්ධ ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | 1.0 බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය හැඳින ගෙන චරිතායනය කරයි. | 1. සුද්ධෝදන රජතුමා විසින් සිදුහත් කුමරුට වන්දනා කරන ලද දෙවන අවස්ථාව ප්‍රකාශ කරයි.<br>2. සිදුහත් කුමරුට ශිල්ප කියා දුන්නේ සර්වමිත්‍ර බමුණු පඬිවරයා බව ප්‍රකාශ කරයි.<br>3. රජකුමරු ශිල්පයෙන් දැක් වූ දක්ෂතා පිළිබඳ ව කතා කරයි.<br>4. රජ්ජුමාලා බමුණු ගෙදර දී විඳි කරදර පිළිබඳ සංවේදී ව කතා කරයි.<br>5. රජ්ජුමාලාට බුදුරදුන් පිහිට වූ අවස්ථාව පිළිබඳ විස්තර කිරීමට ඉදිරිපත් වෙයි. | පිය රජතුමාගේ දෙවන වැඳීම.<br><br>ශිල්ප ඉගෙනීම<br><br>රජ්ජුමාලා කතාව | ක්‍රියාකාරකම 1<br>පියවර 1,2<br><br>ක්‍රියාකාරකම 2<br>පියවර 1,2<br><br>ක්‍රියාකාරකම 3<br>පියවර 1,2<br><br>පෙළ පොතේ<br>1,2,3 පාඩම් | 01<br><br><br><br><br><br><br><br><br>01 - 12 | පැය 5 |

# තුන්වන ශ්‍රේණිය - බුද්ධ ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | 2.0 සුවිශේෂ බෞද්ධ චරිත හා ජාතක කතා හැඳින ආදර්ශයට ගෙන කටයුතු කරයි. | 1. සුද්ධෝදන රජතුමා තුළ පැවති උසස් ගුණාංග ප්‍රකාශ කරයි.<br>2. විසාඛා සිටු දේවිය තුළ පැවති ශ්‍රද්ධාවන්ත ගුණාංග ප්‍රකාශ කරයි.<br>3. මිගාර සිටුතුමා සුමගට ගැනීමට කටයුතු කළ ආකාරය විස්තර කරයි.<br>4. සංඝමිත්තා තෙරණිය ජය ශ්‍රී මහා බෝධිය රැගෙන ලංකාවට පැමිණි අවස්ථාව විස්තර කරයි.<br>5. ජාතක කතාව කතන්දරයක් ලෙස මතකයෙන් කියයි.<br>6. වැඩිහිටියන්ට සැලකීම වටිනා ගුණාංගයක් බව පිළිගනිමින් කතා කරයි. | 1. සුද්ධෝදන රජතුමා | ක්‍රියාකාරකම 01 පියවර 1,2,3,4, පෙළ පොතේ 08 පාඩම | 03<br>28 - 32 | පැය 02 |
| | | | 2 විසාඛා මහෝපාසිකාව | ක්‍රියාකාරකම 02 පියවර 1,2, පෙළ පොතේ 09 පාඩම | 04<br>33 - 36 | පැය 02 |
| | | | 3. සංඝමිත්තා තෙරණිය | ක්‍රියාකාරකම 02 පියවර 1,2, පෙළ පොතේ 09 පාඩම | 37 - 39 | පැය 02 |
| | | | 4. තිත්තිර ජාතකය | ක්‍රියාකාරම 04 පියවර 1,2 ක්‍රියාකාරම 05 පියවර 1, ක්‍රියාකාරම 06 පියවර 1,2 පෙළ පොතේ 11 පාඩම | 05<br>40 - 42 | පැය 02 |

තුන්වන ශ්‍රේණිය - බුද්ධ ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| 03. | බෞද්ධ දරුවකුගේ අනන්‍යතාව තම චර්යාව මඟින් ප්‍රදර්ශනය කරයි. | 01. උපන් දිනය දා පුණ්‍ය ක්‍රියාවක යෙදෙයි. | උපන් දින පිංකම් කිරිම | ක්‍රියාකාරකම 04 පියවර (1.2.3 ) උපන් දින පිංකම් පෙළ පොතේ 06 පාඩම | 8<br>18-22 | පැය 01 |
| | | | | | මුළු කාලය | පැය 14 |

## තුන්වන ශ්‍රේණිය - කතෝලික ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ආදරය මැවිල්ල මඟින් අද්දකියි. තුති පුදයි. ප්‍රතිප්‍රේමය දක්වයි. | ■ පාපයට වැටුණු ආදම් සහ ඒවට දෙවි පියාණන් වහන්සේ සමාව දුන් ආකාරය විස්තර කරයි.<br>■ තම වැරදිවලට සමාව ඉල්ලා දයාවේ කරුණාවේ දෙවි පියාණන් වහන්සේට යාච්ඤාවක් ලියයි. | පාපයට වැටුණු මිනිසාට සමාව දීම මඟින් | පියවර 02<br>පියවර 03<br>පෙළ පොතේ පිටු අංක 10 | 7 හා 8 | පැය 02 |
| | | ■ පවුල තුළ සහයෝගයෙන් ආදරයෙන් කටයුතු කළ හැකි ආකාරය ලියා දක්වයි.<br>■ පාසල තුළ අවනත භාවයෙන් හා සහයෝගයෙන් කටයුතු කළ හැකි අවස්ථා යෝජනා කරයි. | අවනත භාවය සහ සහයෝගය දැක්වීම<br>■ නිවසේ දී<br>■ ගමේ දී/නගරයේ දී<br>■ පාසලේ දී<br>■ දහම් පාසලේ දී | පියවර 01<br>පියවර 04<br>පෙළ පොතේ පිටු අංක 12 | 9 හා 10 | පැය 02 |
| | | ■ විවිධ ආගමික උත්සව අවස්ථාවල දී පන්තියේ ළමයින් සමඟ සහජීවනයෙන් කටයුතු කරමින් මිතුදම් ගොඩනඟා ගත හැකි විවිධ ක්‍රියාකාරකම් ලියා දක්වයි.<br>■ යහපත් මිතුරු සබඳතා පවත්වා ගැනීමට අවශ්‍ය වරම් පතා යාච්ඤාවක් සාමූහික ව උච්චාරණය කරයි. | මිතුදම් ගොඩනඟා ගැනීමෙන්<br>■ අසල්වැසියන් සමඟ<br>■ පන්තියේ ළමයින් සමඟ | පියවර 01<br>පියවර 02<br>පියවර 04<br>පෙළ පොතේ පිටු අංක 14 | 11 හා 12 | පැය 02 |

## තුන්වන ශ්‍රේණිය - කතෝලික ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | | ■ රෝගීන් හා විශේෂ අවශ්‍යතා ඇති අය වෙනුවෙන් සුවය හා කරුණාව ලැබේවා'යි අයැදිමින් දෙවිපියාණන් වහන්සේට යාච්ඤා කරයි.<br>■ සතුන්ට ආදරය දක්වන අයුරු ලියා දක්වමින් එය චිත්‍ර මඟින් ඉදිරිපත් කරයි.<br>■ අසරණ හා අනාථ ළදරු හා මහළු අයගේ අවශ්‍යතා ලැයිස්තු ගත කරයි. | ■ කරුණාව හා දයාව දැක්වීම මඟින්<br>■ රෝගීන්ට හා විශේෂ අවශ්‍යතා ඇති අයට<br>■ අසරණ හා අනාථ අයට<br>■ ළදරු හා මහලු අයට<br>■ සතුන්ට හා ගස්වැල්වලට | පියවර 02<br>පෙළ පොතේ පිටු අංක 16 | 14 | පැය 02 |
| | | ■ පරිසරය පවිත්‍ර ව තබා ගැනීමේ කුඩා අපගේ වගකීම නිසි ලෙස ඉටු කරයි. | ■ පරිසර පවිත්‍රතාව මඟින්<br>■ නිවස හා අවට<br>■ පාසල හා පන්ති කාමරය අවට<br>■ දෙව්මැඳුර හා අවට<br>■ පොදු ස්ථාන | පියවර 1<br>පියවර 02<br>පියවර 03<br>පෙළ පොතේ පිටු අංක 19 | 16 හා 17 | පැය 02 |

තුන්වන ශ්‍රේණිය - කතෝලික ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | මහෝත්තම දෙවි පියාණන් වහන්සේ සමඟ කතා කරයි. | ■ නිවස තුළ දෙවි පියාණන් වහන්සේට කතා කළ හැකි සෑම අවස්ථාවක් ම නම් කරයි. මුළු දවස පුරා දේව ආරක්ෂාවට නතු වෙමින් කිව හැකි යාච්ඤා ප්‍රකාශ කරයි.<br><br>■ පවුලේ සියලු දෙනා එකට එකමුතු වී පවුල් ජපමාලය මගින් දේව වචනය උච්චාරණය කරන බව අවබෝධයෙන් ප්‍රකාශ කරයි. | විවිධ අවස්ථාවන්හි දී<br>■ නිවසේ දී<br>■ අවදි වූ විට නින්දට යාමට පෙර<br>■ පාඩම් කිරීමට පෙර හා පසු<br>■ කෑමට පෙර හා පසු<br>■ ආගම පාඩම පටන් ගැනීමට පෙර හා පසු<br>■ පවුල් ජපමාලය<br>■ ගමන් යාමට පෙර හා පසු | පියවර 02<br>පියවර 03<br>පෙළ පොතේ පිටු අංක 21<br><br>පියවර 02<br>පියවර 04<br>පෙළ පොතේ පිටු අංක 23 | 18 හා 19<br><br><br><br>22 හා 23 | පැය 02<br><br><br><br>පැය 02 |
| | | | | | මුළු කාලය | පැය 14 |

# තුන්වන ශ්‍රේණිය - ක්‍රිස්තියානි ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | ජේසුස් වහන්සේ හඳුනා ගනියි. අනුගමනය කරයි. | ගවලෙනක ඉපදුන සාම කුමරුන් තම ජීවිතයට පිළිගනිමින් නත්තල් සුභ පැතුම් පතක් පිළියෙළ කරයි | 1) සාම කුමරා ගවලෙනක ඉපදීම ශු.ලූක් 2 : 8 - 16 | පියවර 1,2,3, පෙළ පොතේ 6 වන පාඩම | 10 14,15,16 | පැය 02 |
| | | සාම කුමරාණන් වූ ජේසුස් වහන්සේ අනුගමනය කරමින් ශු. මතෙව් 5 : 9 පාඨය වර්ණවත් පොත් සලකුණක් මගින් ඉදිරිපත් කරයි | 2) සාම පණිවිඩය කන්ද උඩ දේශනය ශු. මතෙව් 5 : 8 - 9 | පියවර 1,2,3,4 පෙළ පොතේ 7 වන පාඩම | 11 17 ,18 | පැය 02 |
| | | ජේසුස් වහන්සේ සාමයේ රජු ලෙස කොටළුවකු පිට ජෙරුසලමට පිවිසීම සිදුවීම පිළිබඳ වාක්‍යය කිහිපයක් ලියයි. | 3) සාමයේ රජු ජෙරුසලමට රජුකු සේ පිවිසීම තල් අතු පෙරහැර ශු.ලූක් 19 : 35 - 38 | පියවර 1,2,3,4 පෙළ පොතේ 8 වන පාඩම | 12,13 19 ,20,21 | පැය 02 |
| | ජේසුස් වහන්සේගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගනියි. | අප කරන පෞද්ගලික හා සාමූහික යැදුම්වලට දෙවියන් වහන්සේ පිළිතුරු දෙන බව විශ්වාස කරමින් පෞද්ගලික හා සාමූහික යැදුම්වල යෙදෙයි. | 4) යාච්ඤා කිරීම - කඳු මුදුන්වල ශු. මාක් 6 : 46 සාමූහික යාච්ඤා ශු. මතෙව් 18 : 19 - 20 | පියවර 1,2,3,4 පෙළ පොතේ 9 වන පාඩම | 14,15 22, 23 | පැය 02 |
| | | ජේසුස් වහන්සේ අන් අය උදෙසා කළ යාච්ඤාවෙන් මග පෙන්වීමක් ලබා තම මිතුරු මිතුරියන් උදෙසා යාච්ඤා කරයි. | 5) අනුන් වෙනුවෙන් යැදුම් ශු.ජොහාන් 17 : 20 - 21 | පියවර 1,2 පෙළ පොතේ 10 වන පාඩම | 16 24,25 | පැය 02 |

## තුන්වන ශ්‍රේණිය - ක්‍රිස්තියානි ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | ශුද්ධාත්මයාණන් වහන්සේ හඳුනා ගනියි. | ▪ ඉවසීම, කරුණාව හා යහපත්කම තම ජීවිතයෙන් පිළිඹිබු කළ හැකි අවස්ථාවක් නම් කරයි. | 6) ඉවසීම, කරුණාව හා යහපත්කම ශුද්ධාත්ම ඵල ගලාති 5 : 22 | පියවර 1,2,3,4 පෙළ පොතේ 11 වන පාඩම | 17<br>26,27 | පැය 02 |
| | දේවරාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කරයි. | ▪ නෝවාගේ ජීවිතය පිළිබඳ ශුද්ධ බයිබලයේ පාඨයට සවන් දී නෝවාගේ නැවේ ආකෘතියක් නිර්මාණය කරයි. | 7) දැහැමි බව නෝවා උත්පත්ති 6 : 9 , 7 : 10 | පියවර 1,2,3,4 පෙළ පොතේ 12 වන පාඩම | 18<br>28,29 | පැය 02 |
| | | | | | මුළු කාලය | පැය 14 |